පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 07

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- නර්තනය

පාසලේ නම : ..............................

ඇතුළත්වීම් අංකය : ..............................

කාලය : පැය දෙකයි

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **1 සිට 5 දක්වා ප්‍රශ්න වලට අදාළ පිළිතුර යටින් ඉරක් අඳින්න.**

## I කොටස

1) නම්‍යතා අභ්‍යාස වල නිරත වීමේ වැදගත්කමක් නොවන්නේ,

   i. කායික සංවර්ධනයක් ඇතිවීම.
   ii. ශාරීරික ප්‍රසන්න බව ඇතිවීම.
   iii. අභියෝග වලට මුහුණ දී දරාගැනීමේ හැකියාව ඇති නොවීම.
   iv. මානසික සුවයක් ඇතිවීම.

2) නර්තනයේ මූලික ඉරියව්ව වන්නේ,

   i. ගොඩ සරඹ
   ii. මණ්ඩිය
   iii. නම්‍යතා අභ්‍යාස
   iv. පා සරඹ

3) ගුරුවරම් දීමේ මංගල්‍ය අයත් නර්තන සම්ප්‍රදාය වන්නේ,

   i. උඩරට නර්තන සම්ප්‍රදාය
   ii. පහතරට නර්තන සම්ප්‍රදාය
   iii. සබරගමු නර්තන සම්ප්‍රදාය
   iv. භරත නර්තන සම්ප්‍රදාය

4) උත්සහය නොමැති භාවයෙන් උපදින රසය වන්නේ,

   i. භයානක රසය
   ii. ශාන්ත රසය
   iii. වීර රසය
   iv. රෞද්‍ර රසය

5) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ ඇතුළත් නර්තන අංගයක් වන්නේ,

   i. යක් ඇනුම
   ii. මංගලම්
   iii. වන්නම්
   iv. උඩැක්කි නර්තනය

### ගැළපෙන පිළිතුර යා කරන්න

| | |
|---|---|
| 6) අද වෙස්සන්තර රාජපුතා ගීතය | එම්.එච්.ගෝමස් |
| 7) කරගම් නැටුම | පඬුවස් දෙව් රජු |
| 8) පහතරට ප්‍රවීන නර්තන ඇදුරෙකි | අල්ලාහ් දෙවිඳු |
| 9) කොහොඹා කංකාරිය | ජෝන්ද සිල්වා ශූරින් |
| 10) රාමසාන් උත්සවය | මාරි අම්මාන් හා ගංගා අම්මාන් වරු |

**11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

**(සේරමාන් රජු, උඩරට නර්තනය, වත බැඳීමේ චාරිත්‍රය, හත් අඩියෙ පියුම, තලමල පිබිදීම)**

11) ගම්මුන්ගේ මතය නම් ........................................................ අසුභ සංකේතයකි.

12) ගොක්කොළ මගින් .................................................... ඉතා පහසුවෙන් නිර්මාණය කළ හැකිය.

13) පහන්මඩු ශාන්ති කර්මය සඳහා ................................................ පිළිබඳ කතා පුවත මුල් විය.

14) කතරගම දේවාල පෙරහැරේ .............................................. මඟින් හඳුන්වන්නේ දේවාභාරත වැඩමවන ඇතා සැරසීමයි.

15) ................................................ සඳහා ප්‍රවීණ ශිල්පියෙකු ලෙස ජේ.ඊ.සේදරමන් මහතා හැඳින්විය හැක.

**ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර ඉදිරියේ හරිනම් (√) ලකුණද වැරදි නම් (×) වැරදි ලකුණද යොදන්න.**

16) මල් යහන් කවි උඩරට, පහත රට, සබරගමු සම්ප්‍රදායන් ත්‍රිත්වයටම පොදුය ( )

17) "දොං ජිං ජිං තකට දොංතක දෙතිතට" අයත් බෙර පදයකි. ( )

18) වෙසක් කැකුළු ගීතයේ පද රචනය ඉන්ද්‍රානි විජේබංඩාර මහත්මිය විසින් රචනා කරන ලද්දකි ( )

19) පඬුවස්දෙව් රජුට වැළඳී දිවි දෝෂය සුවපත් කිරීමට දෙවොල්මඩුව ශාන්ති කර්මය සිදු කරන ලදි. ( )

20) සිංහල ජනයා අතර ප්‍රචලිත ගැමි නැටුමක් ලෙස කරගම් හා කාවඩි නැටුම් සැලකිය හැකිය. ( )

(2 × 20)

## <u>නර්තනය - II පත්‍රය</u>

### ප්‍රශ්න 05 ට පිළිතුරු සපයන්න.

1) i. "දොං ජිං ජිං ගජිගත" මාත්‍ර 2 + 4 ට ප්‍රස්තාර කරන්න. (ල 4)

   ii. මල් යහන් කවියක් ලියන්න. (ල 4)

   iii. තුරඟා වන්නමේ කස්තිරම ප්‍රස්තාර කරන්න. (ල 4)

2) i. ගැමි නැටුම් දක්නට ලැබෙන ස්ථාන 3 ක් නම් කරන්න. (ල 3)

   ii. කුලු කවියක් ලියන්න. (ල 4)

   iii. කතරගම දේවාල පෙරහැරේ දක්නට ලැබෙන ද්‍රවිඩ ගැමි නැටුම් 2 ක් නම් කර එකක් හඳුන්වන්න. (ල 5)

3) i. ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් තුනක් ප්‍රවර්ධනයට දායක වන ශිල්පීන් නම් කරන්න. (ල 3)

ii. රද්දැල්ලේ පොඩි මහත්තයා පිළිබඳ හඳුන්වන්න. (ල 6)

iii. තුරඟා වන්නම පිළිබඳ විස්තර කරන්න. (ල 3)

4) i. ප්‍රධාන සම්ප්‍රදායන් තුනකට අයත් ශාන්ති කර්ම නම් කරන්න. (ල 3)

ii. කොහොඹාකංකාරිය පැවැත්වීමට මුල් වූ අතීත හේතුව පිළිබඳ පුරාවෘත්ත කතාව ලියන්න. (ල 6)

iii. පහතරට හෝ සබරගමු ශාන්ති කර්ම වලට අයත් චාරිත්‍ර 03 ක් ලියන්න. (ල 3)

5) i. සිංහල, දෙමළ, මුස්ලිම් ජනවර්ග හා හා බැඳි සංස්කෘතික උත්සව නම් කරන්න. (ල 3)

ii. මින් එක් උත්සවයක් පිළිබඳ විස්තර කරන්න. (ල 6)

iii. පෙරහැරක දක්නට ලැබෙන අංග 03 ක් නම් කරන්න. (ල 3)

6) පහත සඳහන් මාතෘකා තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

- ගොඩ සරඹ
- මල්යහන් කවි
- දෙවොල් මඩුව
- කතරගම දේවාල පෙරහැර
- ජේ.ඊ.සේදරමන් මහතා

7) i. ස්වභාවික අමුද්‍රව්‍ය යොදා සිදුකරන සැරසිලි 03ක් නම් කරන්න (ල 3)

ii. කොස් කොළ, පොල් කොළ, කෙසෙල් බඩ යොදා සිදුකරන ලද නිර්මාණයක් චිත්‍රයට නඟන්න (ල 6)

iii. වෙසක් කැකුළු ගීතය ලියන්න. (ල 3)